සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 1 1/2 යි |

නම / பெயர் / Name ........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

I කොටස

- අංක 1 සිට 4 දක්වා ප්‍රශ්න සඳහා පහත දැක්වෙන උපුටා ගැනීම් පදනම් කර ගනිමින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

A. හතර දෙනා දඟකාරයි
කතුර වගේ කට සූරයි
පාඩම් වැඩ කොහොම වුනත්
සෙල්ලම් දැන් හරි සාරයි

B. කැලේ හරිම ලස්සනයි
දිය ඇලි හෙමිහිට ගලයි
මල් පිපිලා සුවඳ දෙයි
ගෙඩි ඉදිලා සතුට දෙයි

C. සිරසටා ගෙතූ මල් වඩම්
හිස මතු පිටා දිලි තෙලයෙන්
සුවඳටා මල්වල එරොන්
ගෙන යන්නටා එති කැළ බිඟුන්

D. ඉදින් බබෝ ඉදින්
මගේ අතේ ඉඳින්
බොහෝ ආදරෙන් නුඹේ මව මෙන්
රකින්නෙමි මෙමා.

1. ගැමි නාටකයක ඇතුළත් චරිතයකට අදාල ව නිර්මාණය වූ පද්‍ය ඛණ්ඩයක් වන්නේ,

i. A ය.  ii. B ය.  iii. C ය.  iv. D ය.

2. "වැඩක් පළක් නොකර සිට අනුන්ගෙන් යැපෙමින් ජීවත්වීම සුදුසු නොවේ" යන තේමාව මූලික කරගත් නාට්‍යක ඇතුළත් පද්‍ය ඛණ්ඩය වන්නේ,

i. A ය. ii. B ය. iii. C ය. iv. D ය.

3. නාඩගම් නාට්‍ය සම්ප්‍රදාය මූලික කොටගත් ගායනයක් ඇතුළත් පද්‍ය ඛණ්ඩය වන්නේ,

i. A ය. ii. B ය. iii. C ය. iv. D ය.

4. කැලයේ අතරමං වූ දැරියකට මුහුණ දීමට සිදු වූ ගැටලු පිළිබඳ කියැවෙන නාට්‍යයක ඇතුළත් ගීත ඛණ්ඩය වන්නේ,

i. A ය. ii. B ය. iii. C ය. iv. D ය.

**පහත වරහන් තුළ ඇති වචන අතුරින් සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

5. නාට්‍ය පෙළකට අත්‍යවශ්‍ය අංගයක් වන්නේ ................................ ය.

6. උසස්................................ශක්තිය ඇති වූවන්ට ලෝකය වෙනස් අයුරකින් දැකිය හැකිය.

7. මනමේ නාට්‍යයේ මනමේ කුමාරයා සහ වැදි රජු අතර ඇතිවන ද්වන්ධ සටන එම නාට්‍යයේ

............................. අවස්ථාවකි.

8. නාට්‍ය ගීතය අයත් වන්නේ ................................ අභිනයටය.

9. සියලුම ආනුෂංගික ශිල්පීන් හා රංගන ශිල්පීන් එක්ව මංගල දර්ශනයට පෙර කරනු ලබන දර්ශනය

.................................... ලෙස හඳුන්වයි.

(සවේශ පුහුණුව/ආහාර්ය අභිනය/නාට්‍යෝචිත /පරිකල්පන/රංග විධාන/වාචික)

- **අංක 10 සිට 14 දක්වා හරි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද යොදන්න.**

10. කුණ්ඩලකේශී නාට්‍යය ජාතක කතාවක් සාර්ථකව යොදාගෙන නිර්මාණය කරන ලද නාට්‍යයකි. ( )

11. ඉග්නේෂස් ලොයෙලා මුනිවරයාගේ කතාව මුල් කරගෙන සාන්තුවර සෙබලාණෝ නාට්‍ය නිර්මාණය කර ඇත ( )

12. නාට්‍ය පුහුණුව අතර සිදු කරන ඇඳුම් පැළඳුම් සැලසුම් අනුව නාට්‍යයේ වේෂභූෂණ නිර්මාණය කරයි. ( )

13. අභිරූපණ රංගනයේදී සංවාද භාවිතා කරයි. ( )

14. පැහැදිලි හඬක් ඇතිකර ගැනීමට බුද්ධ ගජ්ජය අභ්‍යාස ඉවහල් වේ. ( )

15. “මණ්ඩිත සුහ ගාථ - පණ්ඩිත ජන නාථ” යන්න අයත් වන්නේ,

i. බුද්ධ ගජ්ජයට ය. ii. නම් පොතට ය.

iii. වැදි ගීතයට ය. iv. දැල් ගීතයට ය.

16. පසුතල නිර්මාණ සකස් කිරීමේදී වැදගත් නොවන්නේ,

i. රංග ශෛලිය ය. ii. කාලය ය.

iii. යුගය ය. iv. රූපණය ය.

17. කහ පාට ලොකු මල් සහිත චීත්තයක් සහ කහ පාට අත්බොරිච්චි හැට්ටයක් යොදා ගනිමින් නිරූපණය කළ හැකි නාට්‍යයක චරිතයක් වන්නේ,

i. මනමේ කුමරිය ය. ii. ගම දූව ය.

iii. සිටු දියණිය ය. iv. මාෂා ය.

18. රූපණ කාර්ය සඳහා නළු නිළියන් තෝරා ගැනීම හඳුන්වන්නේ කුමන නමකින්ද?

i. සමාරෝපය නමින් ය. ii. නළුවරණය නමින් ය.

iii. අනුකරණය නමින් ය. iv. නළු කාර්ය නමින් ය.

19. මුනිදාස කුමාරතුංග මහතාගේ ළමා නවකතාවක් වන්නේ?

i. හීන්සැරය ය. ii. අඹ යාලුවෝ ය.

iii. මඩොල් දූව ය. iv. හපනා ය.

20. "සෝභාව දේ මෙපුර සිරි විසිතුරු බලනු මිතුර" ගීතය අයත් නාට්‍ය වන්නේ,

i. තාරාවෝ ඉගිලෙති ය. ii. රතු හැට්ටකාරි ය.

iii. විකෘති ය. iv. ලෝමහංස ය.

(20 x 1 = 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න

1) නැගෙනහිරින් පාරක් ඇතිදෝ
වැලිකුණාටු පිරි මරුකතරයි
බස්නාහිර මොනවා ඇතිදෝ
වළසුන් දිවියන් පිරි වනයයි

1. ඉහත පද්‍ය පන්තිය ඇතුළත් නාට්‍යයේ රචක සහ අධ්‍යක්ෂකගේ නම් ලියන්න. (ලකුණු 2)
2. මෙම නාට්‍ය පෙළ රචනය සඳහා පාදක කරගත් මුල් කෘතිය කුමක්ද? (ලකුණු 2)
3. මෙම නාට්‍යයේ එන ප්‍රධාන චරිතය, වනයේ අතරමං වූ විට ඇය විසින් සොයන ලද යෙහෙළියන් දෙදෙනාගේ නම් සඳහන් කරන්න. (ලකුණු 2)
4. මෙම නාට්‍යයේ එන පහත සඳහන් අවස්ථාවේ ප්‍රේක්ෂකයාට ගත හැකි පාඩම කුමක්ද?
   - මෙම නාට්‍යයේ එන ප්‍රධාන චරිතය වනයේ අතරමං වන අවස්ථාව (ලකුණු 2)
5. මෙම නාට්‍යයෙහි දක්නට ලැබෙන හාස්‍යෝත්පාදක අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 2)

2) i. ඔබ පන්ති කාමරයෙහි සිදු කරන ලද රංග අභ්‍යාස දෙකක් නම් කරන්න (ලකුණු 2)

ii. ඉහතින් සඳහන් කරන ලද රංග අභ්‍යාස අතුරින් එකක් සිදු කරන ආකාරය පියවර වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 3)

iii. රංග ශිල්පියෙකුට රංග අභ්‍යාස වැදගත් වන ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

3) i. නාට්‍යයේ තේමාව යනු කුමක්ද? (ලකුණු 2)

ii. නාට්‍යයකට සුදුසු කතාවක/සිදුවීමක/අවස්ථාවක තිබිය යුතු ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)

iii. පහත සඳහන් කතා වස්තුවල යොදාගෙන ඇති තේමාවන් ලියා දක්වන්න.

- මාෂා සහ වළහා
- අමර ගියා දිව්‍ය ලෝකෙ
- පුංචි අපට දැන් තේරෙයි
- තොප්පි වෙළෙන්දා (ලකුණු 5)

4) i. සතර අභිනය නම් කරන්න. (ලකුණු 2)

ii. ආංගික අභිනය බෙදෙන කොටස් තුන නම්කර එයට උදාහරණ එක බැගින් ලියන්න. (ලකුණු 3)

iii. ඔබට අදාල නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි එන ප්‍රධාන චරිත දෙක සඳහා සුදුසු වේෂභූෂණ (රංග වස්ත්‍ර) රූප සටහනක් මගින් ඇඳ දක්වන්න. (ලකුණු 5)

5) ගතු ඇසූ පමණින් භාර නොගන්නේ
සිතු ලෙස සොයමින් අදහා ගන්නේ
ගතු බොරු කියමින් ලොව නොනසන්නේ
සතු දොස තරමින් තම නො නැසෙන්නේ

මෙම කවිය ඇසුරෙන් කෙටි නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

- නාට්‍යෝචිත සිද්ධි පෙළ ගැසීම
- රංග විධාන (ලකුණු 10)